# 4.3.1/4.3.2 ( මානෙල් ජයසේන හා විජේරත්න වරකාගොඩ )

## 4.3.1 මානෙල් ජයසේන



**උපත:-** නොවැම්බර් 23, 1938, ශ්‍රී ලංකාව

**විපත:-** ජූලි, 24, 2004 ,

**ජීවන තොරතුරු;-** හෙන්රි ජයසේන මහතා ගේ බිරිඳයි . මානෙල් ජයසේන වේදිකා නාට්‍ය වල හා පුංචි තිරයේ නාට්‍ය වල පවා රංගනයෙන් දායක වූවාය. හෙන්රි ජයසේනයන් විසින් නිපදවූ හූනුවටයේ කතාවටද මානෙල් ජයසේන කලාකාරිනිය රංගනයෙන් දායක වූවාය. එය මානෙල් ජයසේන කලාකරිනියගේ ඉමහත් ජනාදරයට හා ජනප්‍රියත්වයට පාදක වූ වේදිකා නාටයක් වූවාය.

❖ **නාට්‍ය කලාවේ දායකත්වය:-**

- 1963 දී ඇය නාට්‍ය ක්ෂේත්‍රයට පිවිසියා ය.
- මානෙල් ජයසේන රංගන ශිල්පිනිය රඟපෑම්, නර්තන නිර්මාණය ඇඳුම් පැලඳුම් නිර්මාණය සහ සහාය අධ්‍යක්ෂණය යන කාර්යය නාට්‍යවලට සහභාගි වී ඇත.
- ඇය රූපවාහිනී නට්‍යවල ද රංගනයේ යෙදී ඇත.

❖ **රංගන දායකත්වය**



- කුවේණි,
- ජනේලය,
- තවත් උදෑසනක්,
- අහස් මාලිගා,
- හුණුවටයේ
- අපට පුතේ මගක් නැතේ,
- මනරංජන වැඩ වර්ජන,
- දිරිය මව සහ දරුවෝ
- යනාදී නාට්‍යයන්හි ඇය රංගනයේ යෙදුනි.

### හුණුවටය නාට්‍යය







# 4.3.2 විජේරත්න වරකාගොඩ



**උපත:-** 21 නොවැම්බර් 1933 (age 87)
කුරුණෑගල,, ශ්‍රී ලංකාව

**අධ්‍යාපනය:- ශාන්ත ඇන්තනීස් විද්‍යාලය කුරුණෑගල ,ආනන්ද විද්‍යාලය කොළඹ**

**රැකියාව:-** හඬ කැවීම් ශිල්පි, ගායන ශිල්පි, රංගනශිල්පි

**ජීවන තොරතුරු:-** විජරත්න වරකගොඩ උපත ලැබුවේ 1933 නොවැම්බර් 21 වන දින, කුරුණෑගලෙහි කුඩා ගම්මානයක ය. එහෙත් ඔහුගේ පියාගේ මුතුන්මිත්තන්ගේ උපන් නගරය මහනුවර හරිස්පත්තුවේ වරකගොඩ ය. ඔහුගේ මව බාස්නායක මුදියන්සලේගේ රන් මෙනිකා ය. ඔහුගේ පියා පොලිසියේ සේවය කළ නිසා ඔහු පාසල් හතකට ගියේය. ඔහු කුරුණෑගල ශාන්ත ආනා විද්‍යාලයේ වසර නවයක් අධ්‍යාපනය ලැබූ අතර කොළඹ ආනන්ද විද්‍යාලයේ අධ්‍යාපනය ලැබීය.1970 දී වරකගොඩ හෙන්රි ජයසේනගේ වේදිකා නාට්‍යයේ කුවේනි හි සම නළුවෙකු වූ චිත්‍රා සමඟ විවාහ විය.

❖ **නාට්‍ය කලාවේ දායකත්වය:-**
- 1963 දී රංගන ක්ෂේත්‍රයට පිවිසියේ ය.
- වේදිකාව, සිනමාව, රූපවාහිනිය සහ ගුවන් විදුලිය යන අංශවල රංගනයේ යෙදුණු ජනප්‍රිය ම රංගන ශිල්පියෙකි.

❖ **රංගන දායකත්වය**

- අජාසත්ත,
- අපට පුතේ මගක් නැතේ,
- කුවේණි,
- ජනේලය,
- මනමේ ,
- තවත් උදෑසනක්,
- මනරංජන වැඩ වර්ජන,
- හුණුවටයේ කතාව,
- දිරිය මව සහ ඇගේ දරුවෝ,
- සිංහබාහු,
- මහාසාර,
- ලෝම හංස,
- කපුවා කපෝති,
- ජේමතී ජායතී සෝකෝ

යනාදී නාට්‍යවල රංගනයේ යෙදී ඇත.



විජේරත්න වරකාගොඩ සිය මනාලිය චිත්‍රා සමඟින්



කෝරලේ මහත්තයා ලෙස මැණිකේ (රත්නාවලී කැකුණවෙල) සමඟින්



මා හේනේ රිරි යකා චිත්‍රපටයේ මාලිනි සමඟ



ජනාධිපති සම්මාන දිනූ "අරුණට පෙර"